**2015 පළමු වාර පරීක්ෂණය 10 ශ්‍රේණිය ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය පිළිතුරු පත්‍රය 1/3**

## I කොටස

| | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 01 | 3 | 02 | 4 | 03 | 1 | 04 | 4 | 05 | 2 | 06 | 3 | 07 | 2 | 08 | 2 |
| 09 | 4 | 10 | 3 | 11 | 1 | 12 | 2 | 13 | 1 | 14 | 3 | 15 | 2 | 16 | 1 |
| 17 | 2 | 18 | 3 | 19 | 4 | 20 | 2 | 21 | 3 | 22 | 2 | 23 | 1 | 24 | 3 |
| 25 | 4 | 26 | 3 | 27 | 2 | 28 | 1 | 29 | 3 | 30 | 2 | 31 | 3 | 32 | 2 |
| 33 | 4 | 34 | 1 | 35 | 2 | 36 | 3 | 37 | 3 | 38 | 2 | 39 | 3 | 40 | 4 |

(ලකුණු 1 x 40 = 40)

## II පත්‍රය

01 (1) ඒක පුද්ගල ව්‍යාපාර සංවිධානයට

(2) ආහාර (එළවළු)

(3) පහසුවෙන් ආරම්භ කළහැකි වීම / සියලුම ලාභ අයිතිකරු සතුවීම / ව්‍යාපාරික තොරතුරුවල රහස්‍යභාවය ආරක්ෂා වීම / තම දක්ෂතා උපරිමව යෙදිය හැකි වීම / තීරණ ගැනීමේ ස්වාධීන බව

(4) වගකීම අසීමිත වීම / අඛණ්ඩ පැවැත්මක් නොමැති වීම / ප්‍රාග්ධනය රැස්කර ගැනීමේ දුෂ්කරතා පැවතීම / ව්‍යාපාරයට නෛතික පුද්ගලභාවයක් හිමි නොවීම / තනිව ගන්නා තීරණ ඇතැම්විට අසාර්ථක වීම.

(5) ලාභ ඉපයීම / පාරිභෝගික තෘප්තිය ඉහළ නැංවීම

(6) භාණ්ඩ හා සේවාවල ගුණත්වය ඉහළ නැංවීම, රැකියා උත්පාදනය

(7) ප්‍රමාණවත් ප්‍රාග්ධනයක් තිබීම / කළමනාකරුගේ අත්දැකීම් / සුවිශේෂී නිෂ්පාදන ක්‍රම

(8) අයිතිකරුගේ මූල්‍ය ශක්තිය ප්‍රමාණවත් නොවීම / තාක්ෂණ දැනුම යාවත්කාලීන නොවීම / ව්‍යාපාරයේ භූගෝලීය පිහිටීම නුසුදුසුවීම / පුහුණු සේවක හිඟය

(9) පාරිභෝගික ජීවන රටාව වෙනස්වීම / නව නගර නිර්මාණය / අධිවේගී මාර්ග ඉදිකිරීම / ව්‍යාපාර සඳහා බදු සහන ලබාදීම / රජය විසින් අඩු පොලී ණය ක්‍රම හඳුන්වාදීම

(10) තරගකරුවන් බිහිවීම / ස්වභාවික ආපදා / නව තාක්ෂණ ක්‍රම සඳහා අනුගතවීම දුෂ්කරවීම (2 x 10 = 20)

02 (1) අවශ්‍යතා

ආහාර, ඇඳුම් පැළඳුම්, නිවාස, අධ්‍යාපනය, සෞඛ්‍යය, ප්‍රවාහනය, ආරක්ෂාව

(2) වුවමනා

බත්, පාන්, පිට්ටු, ඉදිආප්ප / සාරි ගවුම්, කලිසම්, කමිස / තට්ටු නිවාස, කුලී නිවාස / පාසල් අධ්‍යාපනය, පිරිවෙන් අධ්‍යාපනය, පොතපත / රෝහල්, ආයුර්වේදය, බෙහෙත්, වෛද්‍යවරු / බස්, කාර්, වෑන්, ත්‍රීරෝද රථ / පොලීසිය, හමුදාව, දෙමාපියන්

(3) අත්‍යවශ්‍ය වීම / පොදුවීම / නිර්මාණය කළ නොහැකි වීම / සීමිත වීම

(4) අත්‍යවශ්‍ය නොවීම / විවිධ වීම / නිර්මාණය කළ හැකි වීම / සංකීර්ණ වීම / අසීමිත වීම

(5) භාණ්ඩ

ස්පෘෂ්‍යයි, භෞතික පැවැත්මක් ඇත, ඉඩකඩ වැයවේ, ගබඩා කළ හැක, නිෂ්පාදනය හා පරිභෝජනය අවස්ථා දෙකකදී සිදුකළ හැක.

සේවා

අස්පෘෂ්‍යයි, භෞතික පැවැත්මක් නැත, ඉඩකඩ වැය නොවේ, ගබඩා කළ නොහැක, සපයන්නන්ගෙන් වෙන්කළ නොහැක, නිෂ්පාදනය හා පරිභෝජනය එකම අවස්ථාවකදී සිදුවේ. (2 x 5 = 10)

03 (1) A භාණ්ඩ හා සේවා නිෂ්පාදනයේ දී කය වෙහෙසා දායකත්වය සැපයීම කායික ශ්‍රමය නම් වේ. උදා පතල් සේවකයෝ, කම්කරුවෝ

B භාණ්ඩ හා සේවා නිෂ්පාදනයේ දී මනස වෙහෙසා දායකත්වය සැපයීම මානසික ශ්‍රමය නම්වේ. උදා කළමනාකරුවෝ, වෛද්‍යවරු

(2)

| අවශ්‍යතාව | අතීතයේ ඉටුකරගත් ආකාරය | වර්තමානයේ ඉටුකරගන්නා ආකාරය |
|---|---|---|
| 1. ආහාර | ධාන්‍ය, අල වර්ග, මස්, පලතුරු | බත්, පාන්, බනිස්, කොත්තු, පීසා, ආප්ප, ඉදිආප්ප |
| 2. ඇඳුම් | කොළ අතු, ගස්වල පට්ටා, සත්ත්ව හම් | සාරි, කලිසම්, සර්ට්ස්, සල්වාරි ගවුම්, කමිස |

(3) අභ්‍යන්තර පරිසර සාධක අයිතිකරු, කළමනාකරු, සේවකයෝ

බාහිර පරිසර සාධක ගනුදෙනුකරුවෝ, සැපයුම්කරුවෝ, තරගකරුවෝ, දේශපාලන පරිසරය, නෛතික පරිසරය

03 (4)

| ඇල්මැති පාර්ශවය | අරමුණු |
|---|---|
| අයිතිකරුවෝ | ආයෝජනයේ සුරක්ෂිතතාව, ප්‍රමාණවත් ලාභයක් ලැබීම, ව්‍යාපාරයේ අනාගත වර්ධනය |
| කළමනාකරුවෝ | ව්‍යාපාර අරමුණු ඉටුකර ගැනීමට අවශ්‍ය කළමනාකරණ තීරණ ගැනීම හා එම තීරණ ක්‍රියාත්මක කිරීම, රැකියා වර්ධනය හා රැකියා තෘප්තිය |
| සේවකයෝ | සාධාරණ වැටුප් ලැබීමට, රැකියා සුරක්ෂිත බවට |
| ගනුදෙනුකරුවෝ | නිෂ්පාදිත සාධාරණ මිලට ලබාගැනීමට, ගුණාත්මක නිෂ්පාදිත ලබාගැනීමට |
| සැපයුම්කරුවෝ | අඛණ්ඩ ඇණවුම් ලබාගැනීමට, නිසිපරිදි මුදල් ලබාගැනීමට |
| මුල්‍ය ආයතන | දෙන ලද ණය අයකර ගැනීමට, තවත් ණය සැපයීමට |

(5)

| ඇල්මැති පාර්ශවය | දායකත්වය සපයන ආකාරය |
|---|---|
| අයිතිකරුවෝ | ප්‍රාග්ධනය සැපයීමට, ව්‍යාපාර කටයුතු සුපරීක්ෂණයට, ව්‍යාපාර කටයුතු පිළිබඳ උනන්දුව හා කැපවීමට |
| කළමනාකරුවෝ | ව්‍යාපාර සැලසුම් නිසි ලෙස ක්‍රියාත්මක කිරීමට, නිවැරදි තීරණ ගැනීමට |
| සේවකයෝ | පවරන ලද කාර්ය නිසිලෙස ඉටුකිරීමට, ශ්‍රම ඵලදායිතාව වැඩිකිරීමට |
| සැපයුම්කරුවෝ | ගුණාත්මක අමුද්‍රව්‍ය දිගින් දිගටම සැපයීමට, කලට වේලාවට අමුද්‍රව්‍ය සැපයීමට |
| රජය | හිතකර දිරිගැන්වීම් ලැබීමට (2 x 5 = 10) |

04 (1) ඒක පුද්ගල ව්‍යාපාර, හවුල් ව්‍යාපාර, සංස්ථාපිත සමාගම්, සමුපකාර සමිති, සමිති සංවිධාන

(2) වැඩි ප්‍රාග්ධනයක් රැස්කළ හැක, හවුල්කරුවන් සතු විවිධ දක්ෂතා ප්‍රයෝජනයට ගතහැකි වීම, වගකීම හවුල්කරුවන් අතර බෙදාහැරීම, සාමූහික තීරණ ගතහැක. අලාභය බෙදීයාම

(3) වැඩි ප්‍රාග්ධනයක් රැස්කර ගත හැක, නෛතික පුද්ගලභාවයක් හිමිවීම, අඛණ්ඩ පැවැත්මක් තිබීම, වගකීම සීමා සහිත වීම, අධ්‍යක්ෂ මණ්ඩලයක් මගින් කළමනාකරණය කිරීම

(4) ප්‍රජාතන්ත්‍රවාදී පාලනයක් පැවතීම, ස්වේච්ඡා හා විවෘත සාමාජිකත්වය, සාමාජිකයන්ගේ සාමූහික අයිතිය, පොදු අවශ්‍යතා හා අරමුණුවලින් යුක්තවීම.

(5) අනන්‍යතාවක් ලැබීම, ව්‍යාපාර නාමයේ අයිතිය තහවුරු වීම / රජයෙන් ලබාදෙන දිරිගැන්වීම් ලබාගැනීමට සුදුසුකමක් වීම / ණය ලබාගැනීමේ දී පහසුවක් ලැබීම

05 (1) දරුවා ලියන ලද මුදලින් මැනිය හැකි ව්‍යාපාරික ගනුදෙනු 4 කට

(2) ඉඩම් සහ ගොඩනැගිලි, යන්ත්‍රෝපකරණ, ලීබඩු හා උපකරණ තොග, ණය ගැතියන්, අතීත ගනුදෙනුවක ප්‍රතිඵලයක් ලෙස ඇතිවීම, ව්‍යාපාරයේ පාලනයට යටත්වීම, අනාගතයේ දී ව්‍යාපාරයට ආර්ථික ප්‍රතිලාභ ගලාඒම ලක්ෂණ වේ.

(3) අතීත ගනුදෙනුවක ප්‍රතිඵලයක් වීම, බේරුම් කිරීමේ දී ව්‍යාපාරයේ සම්පත්වලින් කොටසක් පිටතට ගලායාම, වර්තමාන බැඳීමක් වීම උදා බැංකු ණය, ණය හිමියෝ

(4) ව්‍යාපාරයක හිමිකරුවන් වෙනුවෙන් පවතින වත්කම් ප්‍රමාණය හිමිකම ලෙස හැඳින්විය හැකිය. එය ගණනය කරනුයේ මුළු වත්කම් වලින් වගකීම් අඩුකිරීමෙනි. (ආදායම් එකතුවීමෙන් හිමිකම වැඩිවේ. නව ප්‍රාග්ධනය ගෙනආවිට ද හිමිකම වැඩිවේ.)

(5) ව්‍යාපාර ඒකකය කෙරෙහි ඇල්මැති පාර්ශවවලට අවශ්‍ය තොරතුරු සැපයීම, ව්‍යාපාරයේ මුල්‍ය තත්ත්වය සතුටුදායක ද යන්න දැනගැනීමට, ව්‍යාපාරය ප්‍රමාණවත් ලාභයක් උපයා තිබේද යන්න දැන ගැනීමට, නීතිමය අවශ්‍යතා ඉටුකිරීමට (2 x 5 = 10)

06 (1) මුළු ආදායම =

| | | | |
|---|---|---|---|
| විකුණුම් ආදායම | රු. | 75000 | |
| කොමිස් ආදායම ලැබුනා | රු. | 3000 | |
| | රු. | 78000 | (ල. 02) |

(2) මුළු වියදම =

| | | | |
|---|---|---|---|
| බඩු තොගයක් ගැනීම | රු. | 50000 | |
| වරිපනම් බිල ගෙවීම | රු. | 500 | |
| රක්ෂණ ගාස්තු ගෙව්වා | රු. | 4000 | |
| කඩ කාමර කුලී ගෙව්වා | රු. | 5000 | |
| | රු. | 59500 | (ල. 02) |

06 (3) සති දෙක අවසානයේ ලැබූ ලාභය

| | | | | |
|---|---|---|---|---|
| මුළු ආදායම | = | රු. | 78000 | |
| අඩු කළා: මුළු වියදම | = | රු. | 59500 | |
| මුළු ලාභය | = | රු. | 18500 | (ල. 02) |

(4)

| | | | | |
|---|---|---|---|---|
| ආරම්භක ප්‍රාග්ධනය | = | රු. | 125000 | (ල. 01) |
| එකතු: අමතර ප්‍රාග්ධනය | = | රු. | 10000 | (ල. 01) |
| සති දෙක අවසානයේ ලාභය | = | රු. | 18500 | (ල. 01) |
| අවසාන ප්‍රාග්ධනය | = | රු. | 153500 | (ල. 01) |

ආරම්භක ප්‍රාග්ධනයට වඩා රු. 33500 කින් අවසාන ප්‍රාග්ධනය වැඩිවී ඇත. එයට හේතුවී ඇත්තේ රු. 10000/ අමතර ප්‍රාග්ධනය යෙදීම හා ලාභය රු. 18500/ ක් එකතුවීමයි.

07 (1) ව්‍යාපාරයේ ඇති මුදල් හෝ භාණ්ඩ අයිතිකරුවන් විසින් පෞද්ගලික ප්‍රයෝජනය සඳහා ලබාගැනීම නිසා අයිතිකරුගේ හිමිකම අඩුවන අතර එය ගැනිලි ලෙස හැඳින්වේ. (ල. 02)

(2)

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1. | ආදායම් | 2. | වියදම් | 3. | වත්කම් | 4. | හිමිකම් | 5. | වියදම් |
| 6. | වගකීම් | 7. | වගකීම් | 8. | ආදායම් | 9. | වත්කම් | 10. | වත්කම් |
| 11. | වියදම් | 12. | ආදායම් | 13. | වියදම් | 14. | වියදම් | 15. | වියදම් |
| 16. | වියදම් | | | | | | | | |

නිවැරදි පිළිතුරු 2 කට ලකුණු 01 බැගින් ලකුණු 08 යි.

The National e-learning Portal for The General Education